රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2008(II)

මගේ අංකය:- EST 7/TPORT/05/1020
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ-07.

2009.03.24

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පලාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**නිල වාහන සඳහා ඉන්ධන සැපයීම සහ එම වාහන**
**<u>රියදුරන් සඳහා අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම</u>**

ඉහත කරුණට අදාලව නිකුත් කර ඇති 2008.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 13/2008 කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයේ 02 ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. අනුයුක්ත කල නිලවාහන හිමිකම් ඇති නිලධාරීන්ට පහත සඳහන් පරිදි මාසික ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ.

| හිමිකම් ලබන නිලධාරීන් | පෙට්‍රල්/ඩීසල් වාහන සඳහා මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය | ඉන්ධන සඳහා අනුමත උපරිම මාසික දීමනාව |
|---|---|---|
| අමාත්‍යාංශ ලේකම් හෝ ඒ හා සමාන නිලධාරීන් | 180 | මසකට අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණය X මාසයේ පලමු දිනට පවතින ඉන්ධන මිල |
| අතිරේක ලේකම් හෝ ඒ හා සමාන නිලධාරීන් | 150 | |
| දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ ඒ හා සමාන නිලධාරීන් | 120 | |
| ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම් | 100 | |

03. ඉහත විධිවිධාන 2009.04.01 දින සිට ක්‍රියාත්මක වන අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/2008 හි සඳහන් අනෙකුත් විධිවිධාන ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වේ.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත නිකුත් කරන ලදි.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය